# ලන්ඩන් කවි
# LONDON KAVI



14A, Buckingham Palace Road, London SW1W 0QP
Tel: 020 7630 6600, Fax: 020 7630 6645



Free Circulation - Vol 2 Issue 7    April-May 2005


## මා හඳුනන දේදුන්නක්

බිං ඌරන් සේ දිව යන පොළොව යටින් ඒ මේ    අත
දුම්රියපොළ කුහුල් වඩන දුටු සැණකින් යළි මා    සිත
ගමන් ගනින දිව රෑ දෙක රකිමින් නිබඳ ව    ගොළුවත
දන්නා හඳුනන මුහුණක් කිසිවිට මා නෙත    නොගැටෙන

තුඟු තන යුග පිපි හිරිගඩු සසොබන ඒ හිම    කැටයම
ඇස නිවනා සළෙලු දනෝ නිබඳ සරති දස අත    හැම
නුහුරු දෙබස් වාගැබ කළඹා පහරයි රිදවයි    ළැම
දෙනෝ දහක් අතර සිටිමි තනි මිනිසෙක් විලසින්    මම

සීත සුළං ඉදිකටු ඇනෙනා වීදිය රෝස පාට මී    පැටියෙක්
විලස දුවන මාගැන නැත බලා සිටින කිසිම    කෙනෙක්
අසනීපෙන් නිඳා නොගත් හිරු ගෙන එන මුදු    දවසක්
තව නුදුටිමි ගමේ වගේ මට සුපුරුදු හිරු    එළියක්

වසන්තයේ හාදු අතුළ තුරු යායට දඬුවම්    දී
දළුමල් කොළ උදුරාගෙන නිරුවත් වී බලා    හිඳී
කුරුලු ගීත අහවර වී සැඟවී නුබ කුසක    නිදී
ලන්ඩන් නගරයෙන් එම්ද කවදා මව් බිමට    මිදී

නෑයෙක් නැති මිතුරෙක් නැති ආ මුත් මේ දුරු    රටකට
සිත සැණකින් ඉගිළී ගොස් පියමන් කර එයි    ගමරට
පාලුව ඉවකර සැඟවුණ දුක මකමින් හදවත    යට
මා හඳුනන දේදුන්නක් පායා එයි අහස්    කුසට

ගාමිණී සුමනසේකර - ලන්ඩන් නගරයේදී
26 ඔක්. 2004



**පිරී සතුට බමන නෙතින් දැක සොඳ අඟනක්    රුසිරූ**
**වෛරී හිඳිනු හෙයින් පැරද දිනනට ඇගෙ හාද    සොඳුරූ**
**සොරී කී බැවින් එ'දැන ගත් කැමරාකරු    කුරිරූ**
**හැරී කුමරු බිඳුණු හදින් බල මැන යුද බට    අයුරූ**

## පියගුණ සමරමි

නොසිතුව දිනක මරණයෙ සුදු සළුව    හැඳ
පියතුම නික්මීලා සත් වසරක්ය    අද
මුදු ගුණ සිහිකරමි දෑඟිලි එකට    බැඳ
පින්පෙත් පුදමි නිවනේ සුව විඳින    ලෙද

සත් වසරක් ගෙවුණි අද ඊයෙක    ගානයි
පියගුණ සුවඳ සිහිවී හදවත    පාරයි
මුව රැඳි සිනා දුක'දුරු දුරු කළ    පානයි
ලැබූ සෙනෙහසට මේ කව්මුතු උප    හාරයි

ගැදි කවකට මිහිරි සිතිවිලි ගලන    පැයේ
කවියක් නිසඳැසක් ලියැවෙන පාළු    රැයේ
රසවත් සිතුම් පන්හිඳකින් ගලා    , ගියේ
ඔබ දුන් දායාද තැන්පත් නිසයි    ලයේ

'පරසතුමල්' පිපී යළි සුසුවඳ    දෙනවා
එය විඳගත් පිරිස ඔබ තතු විම    සනවා
කලාතරුව මැරුණත් ජීවත්    වෙනවා
එම සත් වදන්වල මහිමය වැට    හෙනවා

මරණයෙ හැඩරුවද ඔබගෙන් හැඳින්    නෙමි
දිවියක නිසරු බව වටහා සිටින්    නෙමි
නික්මුණ දිනක ඔබ වෙත පිය නඟන්    නෙමි
මතු අත් බවෙත් පිය පදවිය පුදන්    නෙමි

## සුනාමිය

මහගම සේකර කාව්‍ය පරිකල්පනය



සුමුදු සුදුමුදු තලාවේ
පිපෙන පෙණ පිඩු සිනා සේ........

ගැඹුරු සත් සමුදුරු පතුල බිඳ
ඇඹරි ඇඹරී වියරු දළ රළ
තුමුල මහමෙර දෙදරවයි
බුර බුරා නැඟී කුරිරු ජල කඳ
දෙරණ සම්පත ගිල ගනී



## මුදියන්සේ

පෙර භවයක පිනක බලෙන් මිනිසත් බව යළි ලැබ ගෙන
පුරුෂ ගතක ඉපදීමෙන් එය තව සහතික කර මින
රජ සම්පත් කුඩා වියේ එකිනෙක සැමවිට ලැබ ගෙන
නිදැල්ලෙ යන කැදැල්ලෙකුව මනු දිවියට හැඩගැසු මෙන

සෙල්ලම ලෙල්ලම වූ කල දෙමාපියන් සිතා බලා
පර දෙසකට ඔහු ගිය පසු දෙවනුව ඉගෙනීම කළා
බටහිර ලොව තනිව දුකෙන් යළි සිරිලක යෑම බලා
උපාධි ගණනාවක් ඔහු වසර තුනෙන් ඉවර කළා

කරුමය උරුමයි කියන්නෙ වළකනු බැහැ එය කිසි සේ
මව්බිම හැරදා සිතුවා සැමදා ඉන්නට පුං සේ
තැකුවේ නැහැ සිරිත් විරිත් කබල් ගෑවේ නැහැ වං සේ
සුදු කෙල්ලක් බැඳගත්තා නොවැ අපෙ පොඩි මුදියං සේ

වෙහෙස දරා වැඩට ගොසින් සවසට ඔහු ගෙදර එනවා
අළුගොසු රැල වැනි දරුවෝ ඔහු ගත සිත පාර වනවා
සංකර බිරිඳ ගෙන් ඔහුට සැනසීමක් නොමැතිවනවා
හෙළදිව සිටියා නම් අද මුදියංසේ රජෙක් වෙනවා

සැප සම්පත මුදල බාගෙ තිබුණ ද පර දෙසක දී
ඉහුම පිහුම ඔහු සතුවිය කිසිදා නොකරපු ගෙදර දී
නිතර දෙවොලෙ පසු තැවෙමින් සෝදුක් හදවතට දී දී
දෙවියන් වෙත ආයාචන දිවා රැයේ පුදපෙත් දී

තේ කෝප්ප ඉඳුල් පිඟන් බැලු බැලු හැම තැනම
වියරු වැටෙනවා දුටුව ම ගෙදර දොරේ තිබෙන පෙනුම
දුක දොම්නස තුරුලට ගෙන කරත්තෙ බැඳි ගොනෙකුලෙසින
පෙර කල ලොකු අකුසලයක් ගෙවමින් අද ජීව ගමන

සුදු හමකට වසඟ වෙලා මව් බිම අමතක කළා
දෙමාපියන් හද රිදවා උන් දිවියට වින කළා
වත්කම් ඉගෙනුම කුමට ද දුක ආපසු ඔහු බලා
මුදියන්සේ අන්තිමේදි ලනුවක එල්ලී මලා

ආචාර්ය තිලක් ඇස්. ප්‍රනාන්දු
ලන්ඩනය.

## පිටස්තරයෙක්මි

'ඉන්ටර්නෙට්' ජාලයෙන් සොයාගත්
'ඩිජිටල්' ප්‍රේමයට 'ඊකුවලයිස්' කර
ජීවිතය පරිගණක ගත කළ
'ස්කුරුප්පු' ලලනාවන්ගේ
ඊ-මේල් හාද්දෙන් ඔකඳවී
එච්.අයි.වී. වෛරසයෙන් 'ෂට්ඩවුන්' වූ
'මිලෙනියම්' පරපුරට
'සූට්' නොවූයෙන් 'ඩිලීට්' වී ගිය
පිටස්තරයෙක්මි
මම

එස්.එල්. සෙනෙහෙධීර
ලන්ඩන් මෙට්රොපොලිටන් විශ්වවිද්‍යාලය.

## ආදරණීය ධර්මසිරි සර්

"ශනිදා රසඳුන"ට ඇවිත්
අමතක වුණු ඔබෙ පනාව
අනේ තාම මගේ කාමරේ

ඊළඟ සෙනසුරාදාට
ආයෙත් එන්නම් කිව්වට
එන්නට බැරි තරම් දුරක්
නොදන්වාම ගියේ මොකද?

"නලින්ගෙ ගෙදරට ඇවිදින්
අපි ඉන්නව අපේ වගේ"
එඩ්වින් සර්රුත් එක්කල
කියල හිනැහුණා නේද?

ඒත් ලබන ශනිදාවේ
මුණ නොගැහෙන හින්දා ඔබ
කියන්න ඔබ හමුවන්නේ
කොහේ ද මම?

තිරුවාණා කළු මුදුනක
නැත්තං නාමල් උයනක
හඳපායපු හීත රැයක
ටජ් මහලේ සීගිරියේ
ඉතාලියේ ජර්මනියේ

අනේ මන්ද
නොසොයා ඉන්නම් මම ඔබ
ඔබ ඉන්නව සෑම තැනම

හේමනලින් කරුණාරත්න

## එතෙර ගිය සැමියාට



භවයේ පුරුදු ලෙස
අත් නොහැර මා
හිමි, ඔබ අද
මා ඉදිරියේ රජෙකු මෙන්
පසුපසින් සෙවණැල්ලක් සේ

ගියත් දුරු රට එතෙර
තනිකොට දෙදරුවන් හා මා
දනිමි කිසි ලෙසින්
නොමැති බව අප වෙන්වී
සිතින් දයාබර මා හිමි

බටහිරෙක ගෙවන සුළු කල්
කටුකොහොල් ගිරි දුරද
නොවී ඔබට බාධා
පතන්නම් නියත ජය මඟ

යළි ඔබ එන තුරා මා
දෙදරුවන් රකිමින් පනසේ
ඔබට ගෞරව සේ
හිඳින්නම් මඟ බල බලා
දිවි හිමියනේ
රකිමින් පතිදම්.

අජන්තා සිරිවර්ධන - කෝට්ටේ.

## පෙම්වතිය සරණ ගිය වගයි

සුවඳ පැණින් ඔබ නහවා
සුදු ඇඳුමින් ඔබ සරසා
නච්චගීත වාදන මැද
ඔබ කැන්දාගෙන ගියදා

සමුදුරු සතකින් වෙන්වී
හිරිගඩු පිපි හේමන්තේ
හිස් අහසට ඇස් හරවා
මා කඳුළැල්ලක් වුණ දා

යෞවනයේ පෙම් කතාව
අකාලයේ නිම වුණා ද
සංසාරේ දිගු ගමනේ
තනි ව ම වල්මත් වුණා ද
දුක් ගීයක සුළං රොදක
ඔබ ගේ සුසුමක් දැනේවි
අඳුරු රැයක තරු කිරණක
ඔබ ගේ නෙතු යුග දිලේවි

ගිරිහෙල් රඟ බිම් මැඩගෙන
දියවැල් තණබිම් පසුකර
දිවිමඟ සැරිසරන අතර
මඟ තොටකදි මුණගැසේ ද

අත දරුවකු අත පින්නා
ගී පදයක් මුමුණන දා
නෙතු කොනකින් ගතු කියන්න
මතුවට වරමක් ලැබේ ද?

මෛත්‍රී පනාගොඩ
ඕස්ට්‍රේලියාව.

## ඔරලෝසුව වැඩ කරයි

ඔරලෝසුව වැඩ කරයි
කාලයේ ගමන ඇරඹෙයි
මෝඩ මිනිසුන් හා අස්සයින්
පමණක් වැඩ කරයි

ගතේ වෙර දරාගෙන
හිතේ දුක නිවාගෙන
පැසසුමට ලක්වන දෑ නිපදවයි

ඔරලෝසුව වැඩ කරයි
විරාමයේ සුව ඇරඹෙයි
යන්ත්‍ර හා තවත් යන්ත්‍ර පමණක්
නවතී

බඩේ ගිනි නිවන්නට
සියලු දේ කරන්නට
පැසසුමට ලක්වුණ දෑ මිලදී ගනී

මොහොතකට මම නවතිමි
ඔරලෝසුවේ කටු දෙස බැලීමි
දක්ෂිණාවර්ථව කටු කැරකෙන්නට
ඔරලෝසු හැදුවේ කවුරුද

ඔරලෝසුව වැඩ කරයි
සපුමල් බණ්ඩාර - ලන්ඩනය.

## Right Speech

What do we say, and why do we say it?
Words have power
They can be gifts or weapons
Take care and caution

Speak lovingly
and truthfully
each word
coming from and going to heart.

The word
should bring joy and happiness
peace and harmony
to oneself and others
for reconciliation
and not to cause division.

Harsh speech is painful
for ourselves and others
and will result
in retaliation
and disunity.
Never tell a lie
for the sake of your own advantage
nor for the sake of another's advantage
nor for the sake of any advantage
whatsoever.

Use words
to reflect wisdom
not your
foolishness.

**Ven. Boralesgamuwe Pemaratana**
London Buddhist Vihara

## සීත සමය
## අත වනයි අපට

සිසිල් සුළං හමා
ලදලු පණ පොවා
රාව ගී නඟයි
හදට කොඳුරලා

ළපටි තණ නැවුම්
පිනි පුරා ගෙනත්
සිඹියි යටි පතුල්
දෙවා ගත හිරි

රුක් සෙවණ දෙවූ
පත් සලයි මිහී
පියකරුයි දසුන් ඔබේ
නිල් ගුවන් ගැබේ

මේපල් ගස අගෙයි
නා වණින් දිලේ
කහ රතු පඬු වණින්
පත් සැලේ සියොත් ලෙසේ

පාත්තයෝ කිරි සුදෙන්
පිහිනති පන්ති සෙ ජලේ
කපු පුළුන් කැටී සෙයින්
නැඟී ඇතේ පළිඟු බිමේ

තේම්ස් ගඟ මහා
දිවේ මැදි ලන්ඩනය වටා
දෙමින් සීත සුව පවන්
කතා කරයි සිහින් සරෙන්

හස නඟා නිමල සෙනෙහසින්
විසී කරයි දනා විදෙස්
හැඟුම් අනගි නැඟී එතේ
සොඳුරු සොබා දමේ

කේ.ඒ. පුෂ්පරාණි වික්‍රමරත්න
ලන්ඩනය.

## - බිල්ල -

සුන්දර සිතුවිලි ලියලා දළුලයි ඔබ ප්‍රිය දසුනින්
සමහර විට බිය ජනකයි සසල කරයි හද සැනෙකින්
දෙපා දොවා අපෙ ආපසු යයි ආඩම්බර හැඟුමින්
තුරුලට එන අය වැළඳ ගනී ඔබ කුර්රු හදින් සැලෙමින්

චණ්ඩ මාරුතය ගිල ගති ඔරුතල් ල
උඩින් ඇවිත් සුදු පෙන රළ ගති බිල් ල
ඒ රුධිරයෙන් රතුවෙයි සමුදුර වැල් ල
රතු මුහුදක් හැදෙයි සදහට ඔය නිල් ල

ආඩම්බර උනා සයුරෙහි දිය කඳ ට
ඒ ඉස්සරයි දැන් බැහැ එය කියන්න ට
මිරිකා රැගත් අවිහිංසක රුධිරය ට
ඔබ පැරදුණා අපේ ලේ කඳුලැලි වල ට

සීතා ලිලි ජයසුන්දර - *ලන්ඩනයේ දී*

## ඒ අපූරු මිනිසා

කුඩා සිදුරක් ඇති
බටහිර ඇඳුම ගැලපුණි
මුව පුරා සිනහවකි
නිහතමානී මහතෙකි

පරිනත බුද්ධියකි
සිතුපැතුම් තියුණකි
මානව දයාවෙනි
සුවවෙනව හෙළු දයා දෑසකි

මුස්ලිම් බැතිමතෙකි
සැම ආගමට ගරු ඇති
දැහැමිවූ වියතෙකි
උස්පහත් වූ බේද කිසි නැති

කාස්ටක මුඩුබිමක
දිය පිරී විල් නිලකි
ජාතියට පින් ඇති
දකින්නට වුව දෑසට පිරි ඇති

මුල් ගුරුතුමා වැනි
නිතරම සෙවු බැලුම් ඇති
සැමහටම සිත් ඇති
වියත් පඬියෙකි දැයට වැඩ
ඇති

ලක්බිම ලොවට යන
ලන්ඩන් පුරයේ බැබලුන
මහකොමසරුම වුන
බැබලුන ෆයිස් මුස්තපා මැතිඳු

ප්‍රසාද්
මහකොමසාරිස් කාර්යාලය
ලන්ඩනය.

## යතුර

කලක් ආදරයෙන් වෙලී සිටි තරුණ යුවළක් නොමනාප වී ළඟ ගම්මාන දෙකක වාසය කළෝ ය. දිනක් තරුණයා ඈත ගමකට ගොස් පෙරළා පැමිණෙන අතර රෑ බෝවී නවතින්නට තැනක් සොයන අතර හුරුබුහුටි නිවාසයක් දැක එහි නවතින්නට පුළුවන් දැයි බැලීමට එළඹෙද්දී ඒ තමා ගේ පෙර පෙම්වතිය ගේ නව නිවහන බව අවබෝධ විය. ඔහු දුටු ගමන් ඇය ද අඩියක් පස්සට ගත්තා ය. එවේලේ ඇගේ සැමියා ගෙදර සිටියේ නැත. එහෙත් තරුණයා ගේ ඉල්ලීම ඉවත නොලා ගෙයි එළිපත්තේ පැදුරක් එළා දී එහි සැතපෙන ලෙසත් ඇය ගෙතුළට වී දොරපැළ ලා ගත්තා ය. තරුණියගේ වෙනස පිළිබඳ ව සිත්තැවුලට පත් තරුණයා තම සන්තාපය මෙසේ ඉදිරිපත් කළේලු.

ආදි අපි දෙන්නා දියයට වැලක් වගේ
දැන්දි අපි දෙන්නා දිවි දුටු මුවන් වගේ
දිය නුපුරුදු ගොඩ නුපුරුදු සතුන් වගේ
නුඹලගෙ සෙනේ හුණු නැති බුලත් විට වගේ

එය ඇසූ තරුණිය දොර නෑරම ගෙතුළ සිට මෙසේ කීවාලු.

ආදි අපි දෙන්නා දෙන්නම තමුන්නේ
දැන්දි අපි දෙන්නා දෙන්නම අනුන්ගේ
නොදැන නොවෙයි එළියට පැදුර දුන්නේ
යතුර දෙන්න මේ ගේ දොර අනුන්ගේ

එය ඇසූ තරුණයා අනිත් ඇලයට හැරී නිදා උදේ රැයින් ම එතැනින් පිටත්වී ගියේලු.

## අම්මා

පලායන්න බැරි ජීවිත සටනින්
නෙලාගන්න බැරි එල ගැන සිතමින්
සලා නුවන් කඳුළක මුදු පහසින්
වෙලාගතිම් පාළුව සළු පටකින්

නොබා පැමිණි තනිකම ලහිලහියේ
ඔබා ජීවිතේ තනිවුණ නදියේ
ඉබේ කඳුළු සයුරක් වූ දිනයේ
මගේ ලොවේ ඔබ පමණයි සිටියේ

දෙපා රිදෙනා තුරා
මා පසුපස ම දැවටෙමින්
මේ මහා ගිරි දඹෙන්
නොවැටී එගොඩ වන්නට
මට අත්වැල වන
ආදරණීය අම්මා ඔබ;
ශුෂ්ක බිම්කඩ තෙමා හලනා
අසෙනිය වැස්ස ඔබ,
කිරි වෙහෙර ළඟ දිලෙන
නොනිවෙනා පහන ඔබ


ශ්‍යාමලී ගුණතිලක
ලන්ඩනය.


# ලන්ඩන් කවි

සංස්කාරක - අනුර හැගොඩ
Editor - Anura Hegoda
සංස්කරණ සහය - යසිරු සමරකෝන්
මලිත් හැගොඩ
අනෝමලී - අනුත්තරා
Editorial - Assistance Yasiru Samarakoon
Malith Hegoda
Anomali - Anuthara

වෙබ් අඩවිය කසුන් පලන්සූරිය
Web Design - Kasun Palansuriya


මීළඟ කලාපය සඳහා
ඔබගේ නිර්මාණ
ලන්ඩන් කවි
**14A, Buckingham Palace Road,**
**London SW1W 0QP**
වෙත යොමු කරන්න.



## අනගාරික ධර්මපාල

අනගාරික ධර්මපාල ශ්‍රී නාමය සිහි කරන්න
තෙරුවන් වැඳ උදේ සවස පිං අනුමෝදන් කරන්න

බුද්ධ භූමියට බුදුහිමි ගෙන ගිය පිංවතාණෝය
මූලගන්ධ කුටිය මතින් පෑවූ පුන් සඳාණෝය
රට රටවල මහමුනි බණ පළ කළ දූතයාණෝය
මහාබෝධි සෙවණේ මතු බුදුවන බෝසතාණෝය

සිංහල ගොන් තඩියන්ගේ මොළ සේදූ වෙදාණෝය
සුද්දන්ගේ පාහරකම් මැඬලූ සිහ රදාණෝය
සංකර සිරිතට එරෙහිව හඬ දුන් කථිකයාණෝය
මතු මතු සිරිලක ඉපදිය යුතු යුග පුරුෂයාණෝය

### මමත් ඔබත්

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| අහස | යට | ත් | - | පොළොව | පිට | ත් |
| කවුරු | නැත | ත් | - | ඔබත් | මම | ත් |
| උරණ | වුණ | ත් | - | දබර | වුණ | ත් |
| අදත් | හෙට | ත් | - | ඔබත් | මම | ත් |
| මියුරු | විරි | ත් | - | රැගෙන | ඇවි | ත් |
| ගයන | කවි | ත් | - | අපට | පිරි | ත් |
| හදට | හද | ත් | - | ඔබට | මම | ත් |
| සඳුන් | ගස | ත් | - | සමන් | වැල | ත් |
| විහඟ | තුඩ | ත් | - | ඇලක | හැඩ | ත් |
| ගසක | දලු | ත් | - | තවම | අලු | ත් |
| සඳට | රැය | ත් | - | පෙති | මලට | ත් |
| ඔබට | මම | ත් | - | මම | ඔබට | ත් |

### රාජ රාජ

දරු පැටියට සරණ ලැබේ තිලෝ තිලක බුද්ධරාජ
පිහිටට එයි අනාගතේ තුන් පිටකේ ධර්මරාජ
සැරියුත් මුගලන් වාගේ ළඟම සිටි සංඝරාජ
සිසිල් සෙවණ සුවය සදයි ජයසිරි මහ බෝධිරාජ

නෙළුම් විලට බැස්ස කලට නෙළුම් විලේ පද්මරාජ
මුසාවාද දෙසන අසන සබා ගැබේ සත්‍යරාජ
දෙස බස රැස නසන රුපුන් එඩි බිඳලන විජයරාජ
රජ සිටු මැති වරු හිටියත් මගේ පුතා රාජරාජ

ඉන්ද්‍ර දිගින් ගනඳුර බිඳ පායා එන සූර්යරාජ
වලා පලා නැඟී දිලෙන කලා සපිරි චන්ද්‍රරාජ
අපා දෙපා සිවුපා සත මුළු ගන්වන සිංහරාජ
ගුණෙන් නැණෙන් වැඩුණොත් පුතු මිනිසුන් මැද දිව්‍යරාජ

මහාචාර්ය සුනිල් ආරියරත්නයන් ගේ



ගේය කාව්‍යයෙන් බිඳක්

### නල මුදු සුවඳ කුමට ද?

ඔබ නැති මේ රැයට
පුර සඳ එළිය කුමට ද
ඔබ නැති මේ බිමට
නල මුදු සුවඳ කුමට ද

මහකනදරා වැවට සඳ වැටිලා
දියේ ගිලේය විකල් වී
තුරු හිස හාදු දිදී උන් කිරලුන්
කොහේ ගිහින් ද ඉගිල්ලී

හමුවී ඇසට ඇසක් නැඟු පහන්
නිවී ගියාද නොකල්හි
සුන්දර රාත්‍රියම මවිත සිතින්
බලා හිඳීවි නොසෙල්වී

## ආලයේ තිලකය

ආලයේ තිලකය තබා
ලෝ අඟන අඬ සඳ ලලාටේ
මා නමින් කළ තුඟු සොහොන් ගැබ
දිලෙයි අග්‍රා නගරයේ

අතැර ඇතොවුර
සරාගී දහසක් ළඳුන්
ශුද්ධ වූ සිරි යහන කැප කර
මා නමින්
ලැබුයේ මවෙතින්ය තුදුසක් දූ පුතුන්
හා ජහන් මහ රජුනි ඔබ සැමියෙකි උතුම්

අතුට සුදු කිරිගරුඬ යමුනා තීරයේ
ඔබ තැනූ මේ දේව පාරාදීසයේ
ඇසේ ඔබගේ වියෝ ගී ස්වර මාරුතේ
ටජ්මහල උණු කඳුල අඹු සැමි ප්‍රේමයේ

## උපමා කැඩපතෙන්

| | |
|---|---|
| දිනිදා අවර පත්විය සොමි | කලාවේ |
| ඇවිදා තැනින් තැන ඉඳ මං | මුලාවේ |
| ලැබුදා දිනෙක සිව්සැට රති | කලාවේ |
| හැමදා නියං එකදා | වැහිවලාවේ |

## අලස කුරැල්ලා

| | |
|---|---|
| සිසිර සුවඳ ගත කරනට දකුණු | දෙස |
| යාමට කෙරූ අදිමදි කිරලා | අලස |
| සිසිල් සුළඟ පර වන විට සුව | පහස |
| පමා වුව ද ඇරඹිය උගෙ ගමන | යස |
| | |
| ගහ උඩ සීතලය ගුවන ද ඊට | වැඩි |
| පියඹා යන නමුදු උනු නෑ සිසිල | දැඩි |
| අත්තටු අතර රැඳවුණු ඒ වතුර | පිනි |
| අයිස් බවට පත් විය දැං ගමන | බැරි |
| | |
| අලස කුරැල්ලා අහසින් බිම | වැටුණා |
| සත් ගොවිපළක මැද මිදුලක විත් | රැඳුණා |
| ගෙරියෙක් හෙලපු ගොම පිට උගෙ උඩ | වැටුණා |
| 'වර්චස් වැඩේ' යයි කුරුලා හට | කිවුණා |
| | |
| වර්චස් වුව ද උණු ගොම ගොඩ මැද | කිරලා |
| ඉන්නා විටදි එරෙහිව ගෙරි වෙත | කිපිලා |
| දැනුණා ගොමේ උණුසුම දැන් නැත | සිසිලා |
| කීමට පටන් ගත් ගීයක් හොට | ඇරලා |
| | |
| සිටියා ගොවිපලේ බළලෙක් නිදි | කිරමින් |
| කුතුහල් වුණා සිත උගෙ ඒ ගීත | හඬින් |
| දැක ඒ කුරැල්ලා ඉවතට ගෙන එ | පිඩෙන් |
| කෑවා කටට දෙකකට ඌ රස | කරමින් |
| | |
| කරුණු දෙකක් මා මේ කවියෙන් | කියනා |
| පළමුව මෙයයි සිත් කර සොඳ සේ | අසනා |
| තමා පිටට වර්චස් නිරතුරු | හෙලනා |
| අය සතුරන්ම විය යුතු නැති බව | පෙනෙනා |
| | |
| දෙවැන්න මෙයයි අප කුරුලා ගෙන් සොබ | නා |
| ඉගෙනා ගන්න පාඩම් සිත ගනින් ම | නා |
| වර්චස් ගොඩින් වුව අප ඉවතට ගන් | නා |
| අය මිතුරන් ම විය යුතු නැත බල පෙන් | නා |

රොෂාන් හේරත් - ලන්ඩනය

## ජුකී මැෂිමකට විලංගු වැටුණා

ජුකී මැෂිමකට විලංගු වැටුණා
සිතේ ගතේ සවි එයට වියැකුණා //

සහතික පත් තුළ මැවි ලොව මැකුනා
සිතු පැතු දෑ සිහින බොල් වුණා
මව්පිය සෙවණෙන් දිවිය වෙන් වුණා
ලැලි බෝඩිමක් සැබෑ ලොව වුණා

ජුකී මැෂිමකට විලංගු......./ /

දහවල ගොළු වී මැෂිමක් වන්නේ
මළ හිරු අඳුරේ යදම් ලිහෙන්නේ
මහ මඟ රකුසන් සිනා පුදන්නේ
ගත බිලි ගන්නට මාන බලන්නේ

ජුකී මැෂිමකට විලංගු......../ /

පෙම්බරයෙකු හා අතිනත ගන්නට
දුදරු සම්පත් සෙනෙහ විඳින්නට
නැතිවද වරමක් මේ අත් භවයේ
මගේ ආත්මය සුවපත් වන්නට

ජුකී මැෂිමකට විලංගු......./ /

අඟහිඟ කම් මැද දවස ගෙවෙන්නේ
මව්පිය යුතුකම් නෑ පියවෙන්නෙ
කාටද මේ දුක පවසා ලන්නේ
සිතින් හඬා ගෙන පැදුරේ වැටෙන්නේ

සුගත් සමරකෝන් - ලන්ඩන්ය

## Evergreen

Evergreen trees, you are always so green
Very nice sight to look at
Every time you are around you spread joy around us
Right in the sky
Gosh you are so high
Right above our heads
Every time I see you I feel life
Even in my friend's house
Now your leaves are so green in the coldest times

**Devin Weereasinghe** - London

# සාගර පලන්සූරිය



(1908-1961)

වාහන ගමනාගමනය කෙසේ වුව ද පයින් ගමන් කිරීම පවා ඉතාමත් අසීරු තත්ත්වයක පැවැති එහෙත් ස්වභාව සෞන්දර්යයෙන් අනූන වූ කලල්ඇල්ලේ කොස්වත්ත නම් ග්‍රාමයේ සාගර පලන්සූරිය උපත ලැබුවේ ක්‍රි:ව: 1908 මාර්තු 11 වන දා ය. පලන්සූරිය මොහොට්ටාලගේ ගොරකහාමි සහ හේනක ආරච්චිලාගේ යසෝහාමි නම් දෙමහල්ලන්ට දාව උපන් මේ බිළිඳා ගේ නම රෙජිස්ටාර් ගේ පොතේ ලියැවී තිබුණේ පලන්සූරිය මොහොට්ටාලලාගේ ඩිංගිරි මහත්තයා යනුවෙනි.

උපන් ගම් පියසේ සුන්දර පරිසරයට අනුගත වෙමින් විටෙක හුදෙකලා ව ද, ගමේ ළඳු කැලෑ, ඇළ දොළ ආදියෙහි ඇවිදිමින් ගැමි මිතුරු කැල සමඟ ද කෙළිදෙලෙන් ගත කළ ජීවිතය පසුකාලීන ව ඔහුගේ පද්‍ය රචනාවලට ද විෂය විය. අටකලන්කෝරලේ මාදම්පේ සිංහල පිරිමි පාසලෙන් මූලික අධ්‍යාපනය ලැබ දොළොස්වැනි වියේ දී කලල්ඇල්ලේ පේමානන්ද නමින් පැවිදි විය. කුඩා කල ගෙවූ දඟකාර ජීවිතයට හාත්පසින් ම වෙනස් වූ සන්සුන් පැවිදි ජීවිතයකට අවතීර්ණ වූ පේමානන්ද හිමියෝ මාරපොන ශාස්ත්‍රෝදය හා කොළඹ මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙන්වලින් ඉතා හොඳින් සිය අධ්‍යයන කටයුතු කර ගෙන ගියහ.

එකල රට තුළ පැවැති ශාස්ත්‍රීය උද්යෝගය නිසා බොහෝ සිංහල පුවත්පත් සඟරා ආදිය ප්‍රකාශයට පත් විය. පිරිවෙන් ශිෂ්‍යයෙක් ව සිටිමින් අප හිමියෝ ද එවැනි පුවත්පත් සඟරා ආදියට ලිපි සහ කාව්‍ය රචනා ආදිය ලියන්නට තම කාලය යෙදවූහ. දිනෙන් දින වර්ධනය වන පේමානන්ද හිමියන් ගේ කීර්ති නාමය සහ දියුණු ව ගැන ඊර්ෂ්‍යා කළ අනෙක් භික්ෂූන් ගේ නොයෙක් අවැඩදායි ක්‍රියා නිසා මේ අතර උන් වහන්සේ මහත් කලකිරීමට පත් විය. එහි ප්‍රතිඵලය වූයේ උන් වහන්සේ උපැවිදිවීමයි. නමුත් නැවත බලංගොඩ ආනන්ද මෛත්‍රිය හිමියන් ළඟ කලල්ඇල්ලේ ආනන්ද සාගර නමින් පැවිදි විය. දෙවැනි පැවිදි නමෙහි මුල් ඉංග්‍රීසි අකුරු තුන (කේ. ඒ. එස්.) එක් කළ විට සැදුණු අනවර්ථ නාමයෙන් පෙනී සිටිමින් නැවත කාව්‍යකරණයට පිවිසුණු උන් වහන්සේ සිය ලේඛන කාර්යයන් වඩාත් ක්‍රියාශීලී ලෙස කර ගෙන ගියහ.

1931 දී වැඩිදුර ඉගෙනීම සඳහා ශාන්ති නිකේතනය බලා පිටත් වූ උන් වහන්සේ සය අවුරුද්දක් ඇවෑමෙන් පෙරළා පැමිණ කොළඹ ආනන්ද විද්‍යාලයේ ගුරුවරයෙකු වශයෙන් කටයුතු කළහ. පසු ව කොළඹ නාලන්ද, කුරුණෑගල මලියදේව, මොරටුවේ කුමාර විද්‍යාලය ආදියේ ද සේවය කළේ ය.

1947 යළි උපැවිදි වී විවාහ වූ ඔහු සාගර පලන්සූරිය නමින් එතෙක් නිරත ව සිටි කටයුතු දිගට ම කර ගෙන ගියේ ය. විවාහයෙන් පසු නව යුවළ යාපනයේ පදිංචි වූ අතර සාගර, යාපනයේ වඩුක්කොඩෙහි ජැෆ්නා කොලේජ්හි ගුරුවරයෙකු ලෙස සේවයට පත් විය.

කෙටි කාලයක් 'ලංකාදීප' කර්තෘ මණ්ඩලයේ සේවය කළ අතර 1956 වර්ෂයේ පැවැති මහ මැතිවරණයට හොරණ ආසනයෙන් මහජන එක්සත් පෙරමුණේ අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වී පාර්ලිමේන්තුවට තේරී පත් විය.

අධික කාර්යබහුල ජීවිතයක් ගත කළ සාගර ගේ සෞඛ්‍ය තත්ත්වය ක්‍රමයෙන් අන්ත පිරිහීමට පත් විය. පාර්ලිමේන්තු මන්ත්‍රී පදවිය දරමින් සිටිනා අතර එංගලන්තය බලා ගිය ඔහු නැවත සිය රටට පැමිණි පසු ව එනම් 1959 දී පාර්ලිමේන්තුව විසුරුවා හරින ලදි. ඉබේ ම ඉවත් ව ගිය තම මන්ත්‍රී පදවිය ගැන ඔහු මහත් සතුටට සහ සැහැල්ලුවට පත් වූ බවත් කියැවේ.

1961 මැයි මාසයේ දී ඔහු ගේ රෝගී තත්ත්වය තවත් උග්‍ර වීමෙන් කොළඹ මහාරෝග්‍ය ශාලාවට ඇතුළු කරන ලදි. 1961 ජූනි මස 21 වන දින සාගර පලන්සූරිය කවියා අවසන් හුස්ම හෙළන විට ඔහු ගේ ජීවිතයේ ගෙවී ගොස් තිබුණේ වසර 53ක් පමණි. එහෙත් ඒ වසර කීපය ද අර්ථවත් ලෙස ලොවට වැඩදායි අයුරින් නිමා කිරීම ද සියල්ලට ම වඩා තම රසිකයන් වෙත රසවත් පද්‍ය රචනා සම්භාරයක් ඉතිරි කර යෑම ද නිසා ඔහු සදා ජීවමාන චරිතයක් බවට පත් විය. සුදෝ සුදු, මල්හාමි, කාලකණ්ණියා, කැලණි විත්ති, විසිවුණු තරු, පිළිරුව, අපේ ඇත්තන් ගේ විත්ති වැනි ග්‍රන්ථ ඔහු විසින් විරචිත ය.

"සුදෝ සුදු" කේයස් කවියා ගේ ලේඛන ජීවිතයේ මුල් අවධියේ දී ලියැවුණකි. මාර්ටින් වික්‍රමසිංහ සූරීන් දක්වන අයුරින් එහි බොහෝ අඩුපාඩු, දුර්වලතා ඇති නමුදු තරුණයෙකුට පමණක් නො ව විචාර බුද්ධියෙන් පිරිපුන් වැඩිහිටියෙකුට වුව සතුටක් විඳිය හැකි රසවත් කවි කතාවක් එහි ඇතුළත් ය.

ටිකිරි පොහොසත්ය නැණ ගුණ දෙක වැඩිය
අදිරි දුප්පත්ය ගත සිත හැඩි ඇඩිය
ඇගේ නියමම ආලය කිරනා පඩිය
අදිරි ගෙ පැත්තෙලා බැලුව ම බර වැඩිය

(සුදෝ සුදු)

කතා පහක් වෙන් වෙන් වශයෙන් ගෙන පද්‍යයෙන් ප්‍රකාශයට පත් කළ 'මල්හාමි' සහ විවිධ අවස්ථාවල රචනා කළ 'විසිවුණු තරු', 'කාලකණ්ණියා' ආදි පද්‍ය පසු ව ඉමහත් ජනප්‍රියත්වයට පත් විය.

උපන් දා පටන් කොලුවා ලෙඩ ගානේ
රෑ දාවල් මවට සැනසීමක් නූනේ
කවදා බලන්දෝ කොලුව ගෙ අව සානේ
යන කල්පනාවයි කාගෙත් ගම් මානේ

(කාලකණ්ණියා)

විමලරතන කුමාරගම කේයස් ගේ කවීත්වය ගැන දැක්වූ අදහසක් අවසාන වශයෙන් සඳහන් කරනවා නම් 'කේයස් ගේ භාෂා විලාසය සරලය, ගීතවත්ය, නිරාකුලය, ලලිතය, ඔහු ගේ යෙදුමක දක්නට ලැබෙන නිරහංකාරකමත් තාත්විකත්වයත් ඔහු ගේ කෘතීන් අගය කිරීමට හේතු වී තිබේ' යනුයි.

උදේනි සිරිමාන්න

## ආදරණීය පුංචි අම්මලා වෙතටයි

වැදුමව් පදව් නැති වුවද
මගෙ රත්තරං පුංචි අම්මේ
හැදූ පිනෙන් එළතුම් පදව් උරුම වෙයි
මගෙ සුදු පුංචි අම්මේ

පිදු සෙනෙහෙ දියවරෙන් දැනුදු මම නාමි
මගේ කිරි පුංචි අම්මේ
මුදුගුණය දායාද කළ හෙයින්
බුදු පුතෙකු වීමි මම බුදු පුංචි අම්මේ

කුරුලු ගීත රැව් පිළිරැව් බැද්දේ බටලන්දේ
මාදං කකා කට සරසාගත් ලන්දේ
දර කඩනා අතරතුරේ කටු ඇණගෙන ඔබලයි දුක් වින්දේ
අපි පොල්පිති ගොනුන් හදා
වැල වරකා සුවඳින් පිරි ගස් යට බොරු නින්දේ

පුංචි අම්මලාගෙන් පිරි ඒ සුන්දර ලෝකේ
පුංචි අපට එදා උරුම එකම සිහින ලෝකේ
පුංචි කතන්දරවල මැවූ සුරංගනා ලෝකේ
පුංචි වෙලා දැන් ලෝකය පුංචි අයට නෑ ඒ රන් ලෝකේ
පුංචි අම්මලාටත් මතු අහිමි වෙලා ඒ රන්වන් ලෝකේ

කෝ. ආනන්ද - පැරීසිය

## සත්‍ය සායි පියාණෙනි

භවෙන භවෙ ගෙනා-සියලු දුක් නසා
ශාන්තීවේ සදා-ප්‍රේමයේ අනුහසින්
මුලු ලොවට ම සනසනා
සත්‍ය සායි පියාණෙනී නමස්කාරවේ

මෝහයේ අන්ධකාරයෙන්
දෙනෙත වැසුණු සියලු දෙනතේ දෑස් පාදන
නිසි පාර පෙන්වනා
සත්‍ය සායි පියාණෙනි නමස්කාර වේ

ලොව ශාන්ති සාදනා - සිත දුකෙන් මුදා
පහන් වැටක් සේ - ලොව එළිය කරන
සත්‍ය සායි පියාණෙනි නමස්කාර වේ

කාන්තී අලහකෝන් - ලන්ඩනය

## පවුර උඩ සිට ලියනවා..!

සීතලයි... කරුවලයි
මේ රැයේ අන්තිමයි...
මහ වැස්ස පුපුරමින් වහිනවා
මගේ ඔරලෝසුවත්
ඉකි ගසා දුවනවා....
සැඩ සුළං තව තවත්
නපුරු වී හමනවා...
යන්ඩ බැහැ මේ විදිහට

මට තවත්
අඩියක්වත් යන්ඩ බැහැ
මගේ සිත කියනවා!
මා ළඟට පැන
මගේ මිතුරන්
නොයෙක් පැන අසනවා
.....මට මතකයි... මට මතකයි
මගේ රටේ මම්
හරි සතුටින්-සැනසීමෙන්
හිටියෙ එදා මම්!

එහෙත් අනේ
සෝකයයි-සීතලයි
මා වටකර දැන්!

මගේ පවුලේ උන් ගැන
මට හරි තරහයි... තරහයි
උන් හැමෝම
නටනවා - ගයනවා හිනැහෙමින්
කඳුලක්ය ගලන්නේ මගේ ඇහින්

මට මතකයි
සැනසීමෙන් උණුසුමකින්
හිටියෙ එදා මගේ රටේ
තිබුණෙ නැහැ මේ වගේ දුක් හීතලක්!
යන්ඩ ඕන මට
යන්ඩ ඕන මට පෙරළා
මේ සේරම පෙරළාගෙන.....
සුළඟ මා තෙරපද්දී
මං අඩිය තියනවා
පියවරින් - පියවරට
ආපස්සට

මට සීතලයි... මහන්සියි
ඒත් මං
ළං ළංව සිටිනවා
අවසන් ජය කුලුනට
තවත් එක මීටරයයි
ඉන් පස්සෙ... ඉන් පස්සෙ... මම
එතැන
ම අයිති තැන එතැන!

අනෝමලී හැගොඩ - ලන්ඩනය

පරිවර්තනය : පරාක්‍රම කොඩිතුවක්කු